සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :- .......................................................... කාලය: පැය 02යි.

**I කොටස**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 01 සිට 06 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පාසල් සංවිධාන ව්‍යුහය තුළ පවතින ඉහළම තනතුර කුමක්ද?
1) විදුහල්පති 2) ගුරුවරයා 3) නියෝජ්‍ය විදුහල්පති 4) ප්‍රධාන ශිෂ්‍ය නායක

(02) ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය ආරම්භ කිරීම සඳහා විශාල මෙහෙවරක් ඉටුකළ ප්‍රථම අධ්‍යාපන ඇමතිවරයා වන්නේ,
1) ඩී.එස්.සේනානායක මහතා ය. 2) ලලිත් ඇතුළත් මුදලි මහතා ය.
3) එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා ය. 4) සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා ය.

(03) සැලසුම් සහගත නොවන ශිෂ්‍යයෙකු තුළ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1) පහසුවෙන් අභියෝග ජය ගැනීම. 2) කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම.
3) ආතතියෙන් යුතුව වැඩ කටයුතුවල යෙදීම. 4) ආත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම.

(04) පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය වඩාත් හොඳින් සිසු හදවත් තුළ ජනිත කර වීමට සමත් වන්නේ මින් කවරක්ද?
1) පාසල් කොඩිය 2) පාසල් ගීතය 3) පාසල් සම්ප්‍රදාය 4) පාසල් ලාංඡනය

(05) ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 රෝගයට මුහුණ දුන් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වූ බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක වන්නේ,
1) කොළඹ,ගම්පහ සහ කළුතර ය. 2) ගම්පහ,රත්නපුර සහ කෑගල්ල ය.
3) බදුල්ල,අම්පාර සහ මොණරාගල ය. 4) කළුතර,ගම්පහ සහ මහනුවර ය.

(06) පාසලෙන් සමාජයට සැපයෙන සේවාවක් නොවන්නේ,
1) යහපත් පුරවැසියන් බිහි කිරීම. 2) අනාගත නායකයන් පුහුණු කිරීම.
3) ප්‍රජාවට පණිවිඩ ලබා දීම. 4) පාසල සතු දේපළ ආරක්ෂා කිරීම.

(ලකුණු 2×6=12)

- තීරුවේ සඳහන් පද හා සම්බන්ධ ප්‍රකාශ II තීරුවෙන් නිවැරදිව තෝරා යා කරන්න.

| | I තීරුව | II තීරුව |
|---|---|---|
| (07) | මානව සම්පත | A ලාභ අපේක්ෂාවෙන් තොරව රජය සපයයි |
| (08) | අධ්‍යාපනය | B මිනිසාගේ මැදිහත් වීමෙන් තොරව නිර්මාණය වේ |
| (09) | පොදු දේපල | C යහපත් ජීවිතයට අවස්ථා උදා කරයි |
| (10) | භෞතික පරිසරය | D කායික හා බුද්ධිමය හැකියා දියුණු වීමෙන් බිහි වේ |

(ලකුණු 2×4=8)

- **11 - 15 තෙක් දී ඇති වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(11) ඇම්බැක්ක දේවාලය දේශීය ලී කැටයම් විදහා දක්වන අගනා සංස්කෘතික උරුමයකි ( )

(12) ග්‍රාම නිලධාරී සහතිකය අනුමත කරවා ගැනීමට යා යුතු වන්නේ ප්‍රාදේශීය සභාවටයි ( )

(13) මහනගර සභාවක ප්‍රධානියා වන්නේ සභාපතිය ( )

(14) පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තුවන අරමුණ ''දැක්ම'' තුළින් ප්‍රකාශ වේ ( )

(15) සාකච්ඡා මගින් එකගතාවන්ට එළඹෙමින් කටයුතු කිරීම පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතුවේ ( )

(ලකුණු 2×5=10)

- **16 - 20 තෙක් දී ඇති වාක්‍යවල හිස්තැනට නිවැරදි පිළිතුර යොදා සම්පූර්ණ කරන්න.**

(16) රාජ්‍ය ඔසුසල බිහි කිරීමට පුරෝගාමීව කටයුතු කළ .......................................... මහතාගේ ඖෂධ ප්‍රතිපත්තිය ලෝක සෞඛ්‍ය සංවිධානයේ අවධානයට ද ලක් විය.

(17) වායු ගෝලය දූෂණය වීමෙන්..................................... ස්ථරයට හානි සිදු වේ.

(18) පුද්ගලයින්ගේ බාහිර හැසිරීම පාලනය සඳහා රජය විසින් පනවා ඇති කොන්දේසි .....................................නම් වේ.

(19) නීතිය හා සාමය ආරක්ෂා කරමින් ප්‍රදේශයේ අපරාධ වැළැක්වීම සඳහා සහාය වන රාජ්‍ය ආයතනය වන්නේ ........................................... යි.

(20) ඉතිහාසය පිළිබඳ දැනුම ලබා ගැනීමට උපකාරී වන සියලු දෑ ...........................................යන පොදු නාමයෙන් හැඳින්වේ.

(ලකුණු 2×5=10)


<u>II කොටස</u>

**උපදෙස් :**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) පරිපාලන ඒකක වලට බෙදීම රටක පාලනය පහසු කරයි.

1) ශ්‍රී ලංකාව බෙදා ඇති පරිපාලන ඒකක දැක්වෙන සටහනේ A,B,C තීරු සම්පූර්ණ කරන්න.




(ලකුණු 06)

2) ඔබ පාසල අයත් වන ග්‍රාම නිලධාරී කොට්ඨාසය සඳහන් කරන්න. (ලකුණු 02)

3) ශ්‍රී ලංකාව බෙදා ඇති A-පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව,
B-පළාත් සංඛ්‍යාව අනුපිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 04)

(02) ''තම හැකියා, දක්ෂතා ජීවිත අරමුණු ගොඩනගා ගැනීමට උපකාරී වේ''

1) ඔබ සතු දක්ෂතා හතරක් නම් කරන්න. (ලකුණු 02)

2) ඔබ සතු දුර්වලතා අවම කරගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 04)

3) පුද්ගල හැකියා හා දක්ෂතා වැඩි දියුණු කර ගැනීම සඳහා භාවිතයට ගත හැකි ක්‍රමවේද හතරක් ලියන්න. ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) ''පාසල යහපත් පුරවැසියන් සමාජයට දායාද කරයි''

1) පාසලක පවතින පොදු නීති දෙකක් ලියන්න. (ලකුණු 02)

2) පාසලේ සාමාජිකයෙකු වන ඔබ විසින් ගුරු මණ්ඩලය වෙත ඉටු කළ යුතු යුතුකම් දෙකක් ලියන්න. (ලකුණු 04)

3) A - පාසල් අධ්‍යාපනය සඳහා රජය මගින් සැපයෙන පහසුකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)
B - ඒවා භුක්ති විඳීමේ දී ඔබෙන් ඉටු විය යුතු යුතුකම් පිළිබඳව කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(04) ''මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීමේදී පරිසරයට හානි පැමිණේ''

1) ගොඩබිම දූෂණය වන ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

2) ජලය දූෂණය වීම නිසා ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵල දෙකක් ලියන්න. (ලකුණු 04)

3) පරිසරය සුරැකීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හතරක් යෝජනා කරන්න. ඉන් එකක් ක්‍රියාත්මක කරන ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 06)

(05) ''ශ්‍රී ලාංකිකයන් වන අප අභිමානවත් සංස්කෘතියකට උරුමකම් කියයි''

1) සංස්කෘතියට අයත් අංග හතරක් නම් කරන්න. (ලකුණු 02)

2) අප රට තුළ ඇති ඛණිජ සම්පත් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

3) දේශීය දේ අගය කරමින් කටයුතු කිරීම නිසා අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 06)

(06) ''යහපත් ජීවිතයක් උදෙසා පුරවැසියෙකු විසින් කථනය හා සවන්දීම ප්‍රගුණ කළ යුතු වේ''

1) ආචාරශීලි කථනයේ අංග ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

2) ආචාරශීලි ලෙස භාෂාව භාවිතයෙන් අත්වන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

3) ඵලදායි සන්නිවේදනයෙන් යහපත් අන්තර් පුද්ගල සබඳතා සංවර්ධනයට ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 06)

(07) ''සෑම පුද්ගලයෙකුම මනා විනයකින් හා ශික්ෂණයකින් යුතුව කටයුතු කළ යුතුය''

1) විනය හා ශික්ෂණය සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග හතරක් නම් කරන්න. (ලකුණු 02)

2) මනා විනයක් හා ශික්ෂණයක් පවත්වා ගැනීමෙන් අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

3) වර්තමානයේ මහා මාර්ගයේ සිදුවන රිය අනතුරු වලින් වටිනා ජීවිත රැසක් සමාජයට අහිමිව යයි. මේවා අවම කර ගැනීමට පවත්වා ගත යුතු ජීවන පුරුදු තුනක් කෙටියෙන් ලියන්න. (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය පිළිතුරු

I කොටස - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| (01) 1 | (06) 4 | (11) | (16) සේනක බිබිලේ |
| (02) 4 | (07) D | (12) | (17) ඕසෝන් |
| (03) 3 | (08) C | (13) | (18) නීති |
| (04) 2 | (09) A | (14) | (19) පොලීසිය |
| (05) 1 | (10) B | (15) | (20) මූලාශ්‍රය |

(ලකුණු 2×20=40)

II කොටස - පිළිතුරු

(01)
1) A – පළාත B – දිස්ත්‍රික්කය C - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
2) සිසු පිළිතුරු නිවැරදි නම් ලකුණු ලබා දෙන්න
3) A – 25 B – 9 (ලකුණු 6+2+4=12)

(02)
1) කථිකත්වය, ක්‍රීඩා කිරීම, ගීත ගායනය ..... ආදිය
2) දුර්වලතා හඳුනා ගැනීම, නිහතමානීව පිළි ගැනීම, හඳුනාගත් දුර්වලතා නැවත ඇති නොවන සේ කටයුතු කිරීම, දුර්වලතා නැතිකර ගැනීමේ අධිෂ්ඨානයෙන් කටයුතු කිරීම
3) පුවත්පත්, තම ජීවිත අත්දැකීම්, අන්තර්ජාලය, රූපවාහිනි ගුවන් විදුලි වැඩසටහන්, ප්‍රවීණයන්ගේ අත්දැකීම්, සමාජ කණ්ඩායම් ඇසුරින් ..... ආදිය

(ලකුණු 2+4+6=12)

(03)
1) දිනපතා පාසලට පැමිණීම, පාසල ආරම්භයට පෙර පැමිණීම, පාසල් කාලය තුළ රැඳී සිටීම, කාල සටහනට අනුව අධ්‍යාපන කටයුතුවල නියැලීම ......ආදිය
2) හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම, අවශ්‍ය විට උදව් කිරීම හා සහාය වීම, ආචාරශීලී වීම, ගුරු අවවාද පිළිගෙන කටයුතු කිරීම, ගරු කිරීම හා කීකරු වීම
3) නොමිලයේ අධ්‍යාපනය ලබා දීම, පාසල් පෙළපොත්, නිළ ඇඳුම් ලබා දීම, පුස්තකාල, විද්‍යාගාර, පරිගණක පහසුකම් ලබා දීම.... ආදිය (ලකුණු 2+4+6=12)

(04)
1) අපද්‍රව්‍ය බැහැර කිරීම, වගා කටයුතු සඳහා රසායනික පොහොර කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය, වන විනාශය
2) පානීය ජලය නොමැති වීම, ලෙඩරෝග ඇතිවීම, මත්ස්‍ය සම්පත විනාශ වීම, සත්වයින්ට හානි පැමිණීම.....
3) අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් වැළකීම, වගා කටයුතුවලදී කාබනික පොහොර භාවිතය, නොදිරන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම, කොම්පෝස්ට් නිපදවීම.... ආදී සුදුසු පිළිතුරු (ලකුණු 2+4+6=12)

(05)
1) ආගම, සිරිත් විරිත්, කලා නිර්මාණ, ඇඳුම් පැළඳුම්, දේශීය වෙදකම, සාහිත්‍ය, ආගමික උත්සව....... ආදිය
2) මිනිරන්, මැණික්, පොස්පේට්, ඉල්මනයිට්, වීදුරු වැලි.....
3) දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත හැකිවීම, නව නිමැවුම් බිහි වීම, විදේශ විනිමය ඉතිරිවීම, නව රැකියා අවස්ථා බිහි වීම..... ආදිය (ලකුණු 2+4+6=12)

(06) 1) නිරවුල්ව හා නිවැරදිව අදහස් දැක්වීම, භාෂාව විකෘති නොකිරීම, සංවරශීලීව කතා කිරීම, මුහුණට මුහුණ බලා කතා කිරීම, නිවැරදි ඉරියව්වල පිහිටීම...... ආදිය

2) සැමගේ ගෞරවයට ලක් වීම, යහපත් පුද්ගල සබඳතා ගොඩනැගීම, නායකත්වයට සුදුස්සෙකු වීම, අන් අයගේ ප්‍රසාදය දිනාගත හැකි වීම......ආදිය

3) අන්මත ඉවසීම, විවෘතව අදහස් ඉදිරිපත් කිරීම, අන් අයගේ ඉදිරිපත් කිරීම් අගය කිරීම, තම අදහස් නිරවුල්ව උචිත ලෙස ඉදිරිපත් කිරීම, අන් අයට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.....ආදිය

(ලකුණු 2+4+6=12)

(07) 1) සාරධර්ම ගරු කිරීම, මිත්‍රශීලි බව, අවංක බව, ඉවසීම, සත්‍යගරුක බව, මානව දයාව, සහයෝගී බව.... ආදිය

2) සතුටින් ජීවිතය ගතකළ හැකි වීම, සමාජයේ ගැටුම් අවම වීම, තම අභිමතය හා ගරුත්වය ආරක්ෂා වීම, ජාතික ආගමික සහජීවනයක් ඇති වීම

3) මාර්ග නීති රීති පිළිපැදීම, මාර්ගය පොදු දේපලක් සේ සලකා කටයුතු කිරීම, අන් අයගේත් තමාගේත් ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත්ව කටයුතු කිරීම, මත්පැන් භාවිතයෙන් තොර වීම...... ආදිය

(ලකුණු 2+4+6=12)

I පත්‍රය = 2×20 = 40
II පත්‍රය = 12×5 = 60
මුළු ලකුණු =100